ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී උපාධි පාඨමාලාව - මට්ටම 03
අවසාන පරීක්ෂණය -2024 / 2025
LLU 3261 / LWU 1161 - නීතිය පිළිබඳ අවබෝධය
කාලය පැය 02 යි.

---

දිනය : 2024 දෙසැම්බර් 03 වේලාව: පෙ .ව 9 .30 - පෙ.ව 11.30

---

සම්පූර්ණ ප්‍රශ්න ගණන : 06
ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 බැගින් පිරිනැමේ.
අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. ( i ) පහත නඩු විභාග කිරීම සඳහා නිසි අධිකරණ බලය සහිත අධිකරණය හඳුනාගන්න. ඔබේ පිළිතුර සඳහා හේතු සපයන්න.

(a). අමල් සහ මීනා මෑතකදී විවාහ වූ අතර ,විවාහයෙන් පසුව මීනා වෙනත් පුරුෂයෙකු සමග අනියම් විවාහ සබඳතාවක් පවත්වාගෙන යන බවට අමල් සොයාගත්තා ලදී. එබැවින් , මීනාව දික්කසාද කිරීමට අමල්ට අවශ්‍යව ඇත.

(b). ABC නැමැති ජංගම දුරකථන අලෙවිසැලින් රුපියල් 30,000 /- වටිනා ජංගම දුරකථනයක් සොරකම් කිරීම සම්බන්ධයෙන් අර්ජුන්ව අල්ලා ගෙන ඇත. අර්ජුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගොනු කිරීමට අලෙවිසැල් හිමිකරුවාට අවශ්‍යව ඇත.

(c). සමාජ ක්‍රියාකාරිනියක වන සෙනුරි , ආබාධ සහිත පාර්ශවයන්ගේ අයිතීන් වෙනුවෙන් ක්‍රියා කරයි. රජය විසින් මෑතකදී නිකුත් කරන ලද නව රෙගුලාසියට අනුව රජයේ රැකියා අවස්ථාවන්ගෙන් ආබාධ සහිත පාර්ශවයන් බැහැර කර ඇති බවට සෙනුරි හට දැනගැනීමට ලැබේ. මෙම රෙගුලාසිය අභියෝගයට ලක් කිරීමට සෙනුරිට අවශ්‍යව ඇත.

( 05 X 3 = ලකුණු 15 යි )

(ii) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සතුව පවතින අධිකරණ බලයන් පහක් සුදුසු උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

( ලකුණු 10 යි )

02. (a) 'මූලික අයිතිවාසිකම්' යන යෙදුමෙන් ඔබ තේරුම් ගන්නේ කුමක්ද ? විමසන්න.

( ලකුණු 06 යි )

(b) 1978 , ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කරන ලද මූලික අයිතිවාසිකම් මොනවාද? උදාහරණ සහිතව අයිතිවාසිකම් පෙළගස්වන්න.

( ලකුණු 09 යි )

(c) "රාජ්‍යය විසින් තනි පුද්ගලයින්ට එරෙහිව සිදු කරනු ලබන අත්තනෝමතික සහ අසාධාරණ ක්‍රියාකාරකම් වලට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැදගත් ආරක්ෂාවක් සපයයි."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ හැඳින්වීමක් , 04 වන සැසිය , නීතිය පිළිබඳ අවබෝධය , ඒකකය 1 , 2001 විවෘත විශ්වවිද්‍යාලය , පි. 20

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියේ මූලික සංකල්ප ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

( ලකුණු 10 යි )

03. (a) අර්පණයක් සහ සැලකීමට කරනු ලබන ආරාධනය අතර වෙනස්කම් සාකච්ඡා කරන්න.

( ලකුණු 07 යි )

(b) ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් පවත්නා ප්‍රතිකර්ම විග්‍රහ කරන්න.

( ලකුණු 08 යි )

(c) පහත සඳහන් අවස්ථාවන්හිදී වලංගු ගිවිසුමක් ඇති වී තිබේද යන්න සාකච්ඡා කරන්න.

(i) තමන් විසින් රුපියල් 20,000 /- මාසික දීමනාවක් ගෙවන බවට අරුණ විසින් ඔහුගේ බිරිඳ අංජු වෙත ඔහු රටින් පිටව යන අවස්ථාවේදී පොරොන්දු විය. දැන් අරුණ ඉන්දියාවේ රැකියාවක නිරත වී සිටින නමුත් අංජු වෙත ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කරයි.

(ii) කමල් ගෙන් සොරකම් කරන ලද වාහනය සිය මිතුරෙකුට විකිණීම සඳහා මීනා පොරොන්දු වෙයි. ( 05 x 2 = ලකුණු 10 යි )

04. විශාල් සිය අසල්වැසි වෙළඳසැලක් වන " Vita Mart " හි නිත්‍ය පාරිභෝගිකයෙකි. ඔහුගේ නිවසට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සෑම සතියකම මෙම වෙළඳසැල වෙත පැමිණෙයි. වරෙක ඔහුගේ ප්‍රියතම නැවුම් එළකිරි වර්ගයක් වන 'Puremilky' හි මිල පෙරට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බවට විශාල් හට නිරීක්ෂණය විය. 'Puremilky' නැමැති නැවුම් එළකිරි ලීටර් 01 ක බෝතලයක මිල රුපියල් 600 /- වශයෙන් එහි මිල සඳහන් විය. කෙසේ වුවද , මීට දින 07 කට පෙර මෙම බෝතලයම රුපියල් 400 /- මුදලකට මිළදී ගත් බව විශාල් ගේ මතකයට නැගිණි. ඔහු විසින් වැඩිදුර පරීක්ෂා කිරීමේදී , සත්‍ය මිල වැසෙන පරිදි ලේබලයක් අලවා ඇති බව නිරීක්ෂණය විය. මෙහිදී වෙළඳසැල් කළමනාකාරිණිය වන උපේඛා විසින් අයුතු ලාභයක් ලබා ගැනීමේ අරමුණ සහිතව පෙර තොගයේ මිල අන්තර්ගතය නව මිල අන්තර්ගතයකට වෙනස් කර ඇති බව විශාල් හට තවදුරටත් නිරීක්ෂණය විය. තමා විසින් සිදු කර ඇති අක්‍රමිකතාවය විශාල් හදුනාගෙන ඇති හෙයින් වෙළඳසැල් කළමනාකාරිණිය වන උපේඛා විශාල් හට කිසිදු භාණ්ඩයක් විකිණීම ප්‍රතික්ෂේප කරන ලද අතර වහාම වෙළඳසැලින් පිටව යන ලෙසට විශාල් හට පවසන ලදී. මෙයට අදාලව තමා පාරිභෝගික කටයුතු අධිකාරියට පැමිණිලි කරන බවට විශාල් විසින් වෙළඳසැල් කළමනාකාරිණිය වන උපේඛා හට දන්වන ලදී.

(a). ඉහත දී ඇති සිදුවීමට අදාළව පාරිභෝගිකයෙකු වශයෙන් විශාල්ට හිමිවන ප්‍රධාන අයිතිවාසිකම් පහක් හදුනා ගන්න.

( ලකුණු 15 යි )

(b).2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ කොමසාරිස්වරයාගේ කාර්යයන් සාකච්ඡා කරන්න. ( ලකුණු 10 යි )

05. (a) සේවක සුභසාධනය කෙරෙහි අදාළ වන ඕනෑම ව්‍යවස්ථා දෙකක් තෝරාගෙන එක් එක් ව්‍යවස්ථාවන්හි අරමුණු සාකච්ඡා කරන්න.

( ලකුණු 10 යි )

(b) අරුන් BG හෝල්ඩින්ග්ස් ආයතනයේ සේවකයෙකි. එම ආයතනයේ ගබඩා භාරකරු වශයෙන් ඔහු සේවයේ නියුතු අතර ඔහුගේ සේවා කොන්දේසි පහත පරිදි වේ.

- ඔහුගේ කාර්යයයන් නිම කිරීම සඳහා ගබඩා කාමරයක් ලබා දී තිබුණි.
- ඔහු විසින් පැමිණීමේ ලේඛනයේ අත්සන් කල යුතුව තිබුණි.
- ඔහුට මාසික වේතනයක් ලැබුණි.

තවදුරටත් ඔහුගේ සේවය අවශ්‍ය නොවන බවට BG හෝල්ඩින්ග්ස් ආයතනය විසින් එවන ලද ලිපියක් මෑතකදී අරුණ වෙත ලැබිණි.

අරුණ හට කිසියම් නෛතික ප්‍රතිකර්මයකට එළඹීම සඳහා හැකියාවක් පවතින බව ඔබ සිතන්නෙහිද ? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් උපදෙස් දෙන්න.

( ලකුණු 15 යි )

06 . පහත සඳහන් ඕනෑම පහක් (05) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) නීති විරෝධී ගිවිසුම්

(ii) බලතල බෙදීමේ සිද්ධාන්තය

(iii) නීතියේ මූලාශ්‍ර

(iv) අර්පණය අවසන් වීම

(v) සාමූහික ගිවිසුම්

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය

( 05 x 5 = ලකුණු 25 යි )

*** හිමිකම් ඇවිරිණි ***